2024 දෙසැම්බර් මස 14 වන දින කුරුණෑගල මලියදේව විද්‍යාලයේ ප්‍රධාන ශාලාවෙහි පැවැත්වූ "ඩී.බී. දිසානායක හිටපු විදුහල්පතිතුමාගේ 101 වන ජන්ම දින සැමරුම් උත්සවයෙ හි දී" 47 වන අග්‍ර විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය විසින් පවත්වන ලද ප්‍රධාන දේශනය

## <u>අධ්‍යාපනය තුලින් පෞරුෂ සංවර්ධනය</u>

ගරු විදුහල්පතිතුමා ඇතුලු ආචාර්ය මණ්ඩලයේ ගුරු පියවරුනි, ගුරු මෑණිවරුනි, ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමා ඇතුලු සියලුම සොයුරිනි, අපේ කාලයේ දිසාපාමොක් "ගරු ඩී.බී. දිසානායක හිටපු විදුහල්පතිතුමා" ගේ පවුලේ සොයුරු සොයුරියනි, කොළඹ ආනන්ද මහා විදුහලේ විදුහල්පතිතුමා ඇතුලු ගෞරවනීය ආරාධිත මහත්ම මහත්මියෙනි,

අද දිනයේදී පවත්වනු ලබන මෙම මහගු උත්සවයේ කොටස්කරුවෙකු වීම සඳහා මා වෙත ඉඩ ප්‍රස්තාව ලබා දුන් මෙම උත්සවය සංවිධානය කළ ගෞරවනීය ආදි ශිෂ්‍ය සොයුරනි,

පළමු කොටම ඔබ සැමට මාගේ ස්තූතිය පුද කරනු කැමැත්තෙමි. එමෙන්ම අද දිනයේදී එක්සිය එක්වන ජන්ම සංවත්සරය අනුස්මරණය කරමින් ගෞරවයෙන් සිහිපත් කරනු ලබන අප විදුහල්පති ඩී.බී. දිසානායක මැතිතුමාට මාගේ ගෞරවනීය ආචාරය මේ සමග පිරිනමමි.

මෙවැනි කෘතඥතා පූර්වක මෙහෙවරක් සඳහා ඔබ අප සැම එක් කරමින් එකම අරමුණක් උදෙසා මේ පැය කිහිපය, වෙන් කිරීමට ලැබීම ගැන ඉමහත් සතුටට පත්වන අතර, අපගේ එදිනෙදා රාජකාරි සහ දෛනික කටයුතු වලින් ඉවත්ව අද දිනයේ දී ඔබ සැම සමග එක් වීමට ලැබීම මහත් භාග්‍යයක් කොට සළකමි.

පෞද්ගලිකවම සළකා බලන කල මාගේ ජීවිතයේ වසර 14 කට ආසන්න වූ කාලයක් මා හට සෙවන ලබා දුන් විදුහල් මෑණියන් හමුවට පැමිණීමට මේ ලද අවස්ථාව මාගේ මතකයේ සුවිශේෂී ලෙස සනිටුහන් වේ.

මේ භූමියට පා තැබූ සැණින් මා අත් විඳි ඒ සුන්දර වූ කාල පරිච්ඡේදයෙහි මතක සටහන් එකිනෙකට ගැලපෙමින් සිහිපත් වීම නොවැළැක්විය හැකි සංසිද්ධියක් වන අතරම, එම කාලයේදී අධ්‍යාපනය සහ අනිකුත් පාසල සම්බන්ධ ක්‍රියාකාරකම් තුලින්

මා ලබාගත් ජයග්‍රහණයන් සියල්ලම පසුකාලීන ජීවිත පරිච්ඡේදයන් හිදී මුහුණ දුන් අභියෝගයන් ජය ගැනීමට ඉමහත් රුකුලක් වූ බව ඉතාමත් කෘතවේදී හදකින් සිහිපත් කරමි.

ඔබ අප සැමට මෙවන් අවස්ථාවක් උදා කර ගැනීමට මග හදා දෙමින් මීට දශක පහළොවකට පමණ පෙර ආරම්භ වූ අධ්‍යාපන පරිණාමයේ ක්‍රියාදාමයට අප සැමගේ ගෞරවනීය උපහාරය පුද කරනු ලැබිය යුතුමය.

අප මවුබිමේ අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජයික පරිවර්තනයන් සිදුකරමින් මුලු මහත් සමාජයටම ආලෝකයක් ලබා දීමට තුඩු දුන් සංසිද්ධියේ ආරම්භය මීට දශක පහළොවකට පමණ පෙර සනිටුහන් වූ බව අප සැම දන්නා කරුණකි. ඒ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයන්ගේ උරුමකරුවන් වීමට ලැබීම මෙම දිවියේදී අප ලද්දා වූ මහත් භාග්‍යයක් බව නොරහසකි.

වර්ෂ 1880 මැයි මස 16 වන දින ඇමරිකා එක්සත් ජනපදයේ සිට අප දිවයිනට පැමිණි කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා සිදුකල ඒ පරිවර්තනය අප සැමට සෞභාග්‍ය උදා කර දී ඇත. ලක්දිවට පැමිණීමට පෙර පටන්ම එතුමා ජාති භේද, කුළ භේද, ආගම් භේද දුරලා සමස්ථ මනුෂ්‍ය ප්‍රජාව එකම සහෝදර බැම්මකින් බැඳ තැබීම සියලු ආගම් ධර්මයන් සියලු න්‍යායයන් අපක්ෂපාතීව ප්‍රගුණ කිරීමට උර දීම, ස්වභාව ධර්මය පිළිබඳවත් මිනිසාගේ අභ්‍යන්තර බලය පිළිබඳවත් කරුණු ගවේෂණය කිරීමේ පරමාර්ථයන් මුල්කර ගෙන, වර්ෂ 1857 දී පරම විඥනාර්ථ සමිතිය ප්‍රතිෂ්ඨාපනය කෙරුනි. එහි ආදර්ශ පාඨය වූයේ "සත්‍යයට වඩා උසස් ආගමක් නැත" යන්නයි.

එතුමාගේ ලක්දිව සම්ප්‍රාප්තියෙන් මාසයක් වැනි කෙටි කලක් තුලදීම කොළඹ බෞද්ධ පරම විඥානාර්ථ සමාගම පිහිටුවා ඉන්පසු දිවයිනේ බොහෝ පළාත් වල වෙන් වෙන්ව ශාඛා සමිති පිහිටුවීමට කටයුතු කර ඇත. එයින් නොනැවතී වර්ෂ 1886 පටන් මෙතුමාගේ නායකත්වයෙන් යුක්තව පරම විඥානාර්ථ සමාගම මගින් දිවයින තුල පිහිට වූ ආයතන හරහා විධිමත් අධ්‍යාපනය ලබා දීම සඳහා වූ වපසරියේ ඉතාමත්ම ඉහළ අගයකින් වූ වැඩිදියුණු කිරීම, සමස්ත සමාජයේම අභිවෘද්ධියට හේතු පාදක වූ බව සත්‍යයකි.

එම සේවාවේ වැදගත් වූ සංධිස්ථානයක් ලෙස හඳුනාගත හැකි වන්නේ පවත්නා තොරතුරු අනුව වර්ෂ 1888 දී කුරුණෑගල මලියදේව විදුහලේ ආරම්භයයි. එතෙක් පටන් දශක 14 කට ආසන්න කාලයක් තුල අප පාසැල් මාතාව දිනෙන් දින දියුණුවෙන් දියුණුවට පත් වෙමින් කුරුණෑගලට හෝ වයඹ පළාතට පමණක් සීමා නොවී මුලු මහත් දිවයිනටම අප්‍රමාණ සේවාවක් ඉටු කරමින් යන්නා වූ මේ ගමන් මග අප කාගෙත් සතුටට මෙන්ම පැසසුමට ද ලක්විය යුතුය.

මෙම දශක 14 ක කාල සීමාව තුල හඳුනාගත හැකි වූ ඉතාමත්ම වටිනා කාල පරිච්ඡේදයන් ලෙස, වසර 1962 සිට 1967 දක්වා වූ කාල වකවානුව මෙන්ම වසර 1970 සිට 1978 දක්වා වූ කාල වකවානුවත් අවිවාදයෙන් යුතුව පිළිගත හැකිය. සමස්ථයක් ලෙස දශක එකහමාරක් වූ මෙම කාලය අප විදුහල් මාතාවගේ සහ සිසු දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා, අද දිනයේ අප සැමගේ උපහාරයට පාත්‍ර වන්නා වූ ඒ යුග පුරුෂයාණන් වූ හිටපු විදුහල්පති ඩී.බී. දිසානායක මැතිතුමාගේ කැපවීම සදා ණයගැති ලෙස අප මතකයේ තැන්පත් වීම අතිශයෝක්තියක් නොවේ. එතුමා කල ඒ සුවිශේෂී මෙහෙවරට අපගේ ප්‍රණාමය පුද කරමු.

වර්ෂ 2021 දී සිදුකල සංගණනයකට අනුව අප දිවයිනේ පිහිටි රජයේ පාසැල් ගණන දස දහසකට ආසන්න ප්‍රමාණයක් වූ අතර, සිසුන් දශ ලක්ෂ හතරක පමණ ප්‍රමාණයක් එහි ඉගෙනුම ලබමින් සිටියහ. එමෙන්ම පිරිවෙන්ද ඇතුලුව අනෙකුත් පුද්ගලික පාසැල් 930 ක පමණ සිසුන් දෙලක්ෂයක් පමණ ඉගෙනුම ලබති. පූර්ණ වශයෙන් ගත්කල අධ්‍යාපන ආයතන එකොළොස් දහසක පමණ සිසුන් හතළිස් දෙලක්ෂයක් පමණ විධිමත් ඉගෙනීමේ නිරත වේ.

වසර 2001 දී කරන ලද සංගණනයකට අනුව වයස අවුරුදු 6 ත් 19 ත් අතර, ජනග්‍රහණයේ 94% ක්ම ආයතනිකව විධිමත් අධ්‍යාපනයක් ලැබීම එලදායි කාරණාවකි.

එය එසේ වුවත් "අධ්‍යාපනය" යන්න අපට මෙම ආයතනයන් තුලින් ලබාගන්නා වූ විධිමත් අධ්‍යාපනයටම පමණක් කැටිකර සීමා කල හැකි ද යන්න විමසා බැලීම වටී. ඊට හේතුව වන්නේ අප ඉපදුණු දා පටන් ගමනාන්තය දක්වාම ලබන්නා වූ අත්දැකීම්, ක්‍රියාකාරකම් තුලින්ද බුද්ධියේ වර්ධනයක් මෙමන්ම අප සමස්ත හැසිරීම් රටාවෙහි දිශානතිය ද තීරණය වීම නොරහසක් බවයි. මෙම ක්‍රියාවලියට අප සැවොම බඳුන් වීම ස්වභාවධර්මයේ දායාදයක් බව කිව හැකිය. නිවසේදී දෙමාපිය සහෝදර ඥාතීන් වැන්නන්

සමග කෙරෙන්නා වූ අන්‍යෝන්‍ය කටයුතු මෙන්ම නිවසින් පිටතදී පොදුවේ සමාජයේ හැසිරෙන විට ලබන්නා වූ ආභාෂයන් ද ඉතා වැදගත් සාධකයන් වේ. විධිමත් අධ්‍යාපනය ලබා ගැනීමට ආයතනයන්ගේ සහාය නොපතා නිවස තුලදීම එය ලබා ගැනීම ප්‍රාර්ථනා කරන්නා වූ කොට්ඨාශයක්ද අප අතර සිටී. සමහර විට එම ප්‍රතිශතය අප රටෙහි ඉතාමත්ම අඩු මට්ටමක පවතිනවා වුව ද එය එහෙම පිටින්ම නොසලකා හැරිය ද නොහැකිය.

අප මනුෂ්‍ය සමාජයේ අධ්‍යාපනය ලබා ගැනීමේ ක්‍රම මේ අයුරින් විධිමත් සහ අවිධිමත් ලෙස හැඩගැසුණු ආකාර 3 කින් හඳුනාගත හැකිය. එය එසේ වුවද, මෙම ක්‍රමවේදයන් තුලින් නිසි අධ්‍යාපනයක් ලබා මනා පෞරුෂයන් ඇති වීමට නම් මෙම ක්‍රමයන් සමගාමීව සිදු වීම ඉතාමත් වැදගත් වන අතර, එක් ක්‍රමවේදයක් වෙත යොමු වීමෙන් පමණක් සමස්ත සමාජයේ යහපත හා උන්නතිය ලගා කර ගත හැකි ද යන්න විමසීම කාලෝචිත වේ. මෙම ක්‍රමයන් අතුරින් ආයතන තුලින් විධිමත් අධ්‍යාපනයක් ලැබීමෙන් මනා පෞරුෂයක් ලැබෙන බව අපට තරයේ විශ්වාස කල හැකි කරුණක් වේ.

මේ නිසාම පාසැල් තුලින් ලබාදෙන විධිමත් අධ්‍යාපන ක්‍රමවේදයන්හි පරාසය පිළිබඳව නිසි අවබෝධයකින් කටයුතු කිරීම හුදෙක් වැදගත් වේ.

එවැනි ගුණාංගයන් ප්‍රගුණ කරමින් සාධාරණ අවබෝධයකින් කටයුතු කිරීම විධිමත් අධ්‍යාපන ආයතනවල නායක කාරකාදීන්ගේ යුතුකමක් මෙන්ම වගකීමක් ද වේ. එකී වගකීමේ සාධාරණභාවය මුලු සමාජයකම යහ පැවැත්ම සඳහා රුකුල් දෙනු ඇත. එවැනි පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීම තුලින් මතු කර ගන්නා වූ පෞරුෂය මතින් පාසැල් අධ්‍යාපනය නිමා කර සමාජයට පිවිසෙන යොවුන් පුරවැසියෙකුගෙන් සමස්ත සමාජයේම යහපත සඳහා නිම කල නොහැකි වටිනාකමකින් යුත් අනුග්‍රහයක් ලැබෙනු ඇත.

සමාජයක ජීවත්වන සාමාජිකයින් හට අඩු තරමින් අන් අයට හිංසා නොවන ලෙස ජීවත් වීමේ චර්යාවක් හිමි වූ පෞරුෂත්වයක් ගොඩ නගා ගැනීමට හැකිවන්නේ නම්, ඉන් මුලු මහත් මනුෂ්‍ය සංහතියට මෙන්ම පරිසරයටද සිදුවන යහපත මුලු මනුෂ්‍ය ප්‍රජාවේම සුභ සිද්ධියට හේතු භූත වනු ඇත.

පුරාතන ඉන්දියාවේ අධ්‍යාපනය පිළිබඳව වූ කෘතියකින් උපුටා "බාලා දත් ගුප්තා" විසින් දක්වා ඇති පරිදි අධ්‍යාපන ක්‍රියාදාමයේ ප්‍රධාන සංඝටකයන් ලෙස, නිසි ලෙස ඉලක්කාගත වූ ඉගෙනීමේ ක්‍රමවේද, දැණුම ලබා දීමේ විධිමත් සහ අවිධිමත් ආයතන සහ අවකාශමය (Spatial) සහ සංස්කෘතිමය වෙනස් වීම දක්වා ඇත.

තවද, අධ්‍යාපන ක්‍රියාවලිය තම පවුල තුලින් ආරම්භ වී තම නෑදෑ පරපුර හා හිතමිත්‍රාදීන් හරහා පුලුල් වී විධිමත් හා අවිධිමත් වූ ආයතනයක් දක්වා විකාශය වන බව දක්වා ඇත.

එමෙන්ම මෙම ක්‍රියාවලිය ළඳරු වියේදී ආරම්භව යෞවනය හරහා ඉදිරියට ගමන් කරමින් ජීවිතාන්තය දක්වාම වූ විකාශයකි.

ඉන්දියානු හින්දු සමාජ විකාශයේ මුල් අදියරයන් වන වෛදික, ජෛන, බෞද්ධ, බ්‍රාහ්මණ යුගයන් හි අධ්‍යාපන ආයතන ලෙස ගුරුකුල, ආශ්‍රම හා තපෝවන හඳුනාගෙන ඇති අතර, එම ආයතන පසුව පන්සල් හා පිරිවෙන් දක්වා දිගු වී ඇත.

ආදි කාලීන හින්දු සමාජය දැනුමට සහ අධ්‍යාපනයට මූලික ස්ථානයක් හිමිකර දුන් බව හින්දු ආප්තෝපදේශ ග්‍රන්ථයන්හි සංස්කෘත බසින් ලියා දක්වා ඇති මෙවැනි ශ්ලෝක යෙදුම් වලින් මනාව පිළිබිඹු වේ.

විද්‍යා නාම නරස්‍ය රූප මදිකං
විද්‍යා ප්‍රගුප්තං ධනං
විද්‍යා භෝගකරී යසස් සුඛ කරී
විද්‍යා ගුරූනාං ගුරු ඃ
විද්‍යා බන්ධු ජනේ විදේශ ගමනේ
විද්‍යා පරං දෛවතං
විද්‍යා රාජ සුපූජිතා භූවී නරෝ
විද්‍යා විහීනාං පංශු ඃ

"විද්‍යා" යන්නෙන් අධ්‍යාපනය දැනුම යන්න හගවන මෙම ශ්ලෝකයේ අවසාන පදයට පමණක් හිත යොමු කිරීමම හොඳටම ප්‍රමාණවත්. විද්‍යාව ඇති තැන සියලු ගුණ කීමට අමතරව විද්‍යාව හීන වූ තැන පශූඃ හෙවත් තිරශ්චීන තත්ත්වයක් ඇති බව මෙහි තේරුමයි.

බෞද්ධ සාහිත්‍යයේ ජාතක කථා වස්තූන්ගෙන් කියවෙන පරිදි සමාජයේ රාජකීය සහ ධනවත් වෙළඳ පවුල් වලට සීමා වූ අධ්‍යාපනය දිසාපාමොක් ආචාර්යයන් ලෙස හැඳින්වූ බ්‍රහ්මාචාර්යවරුන් මගින් සිදුකර ඇති අතර, තම පෞද්ගලික නිවසේ නේවාසික පහසුකම් සපයා දී සිසුන් නවතාගෙන අධ්‍යාපනය ලබා දීම කෙරී ඇත. එවැනි ආයතනික අධ්‍යාපනයට එකල්හී දරුවෙක් යොමු වන විට අවුරුදු 12 ක පමණ වයසක් ගත වී ඇති අතර, එතෙක් කලක් දෙමාපිය ඇසුරින් ලත් ආභාෂයෙන් දැනුම පෝෂණය වී තිබෙන්නට පුලුවන.

පසුව ඔවුන් දුරුකතර ගෙවා ගෙන ගොස් තම ආචාර්යවරයාගේ නිවසට පැමිණ අධ්‍යාපන කටයුතු නිමා වන තෙක් එහි නිත්‍ය ලෙස නැවතී ලැගුම්ගෙන නිසි වයස වන වයස 16 පමණ වන විට සහකාරියක් සමග හවුල් වී අලුත් ජීවිතයක් පටන් ගෙන තම පියාගේ කටයුතු සඳහා වගකීම් භාර ගැනීම සඳහා නැවතත් ගම් බිම් බලා යෑම සිරිතක්ව පැවතුණි. බොහෝ විට ආචාර්යයන්ගේ විශ්වාසය සහ හොඳ හිත දිනාගන්නා ශිෂ්‍යයා හට තම දියණිය විවාහ කර දීමේ සිරිතක්ද මේ අතරේ විය. මෙම අවස්ථාව උදා වූයේ පුරුෂ දරුවන්ට පමණක් විය.

නමුත් පසුකාලීනව බුදුරජාණන් වහන්සේගේ පූර්ණ අනුග්‍රහය යටතේ බෞද්ධ අධ්‍යාපනය ලබා දීම සඳහා මෙහෙණි සස්න ඇති කිරීම මගින් අධ්‍යාපනය ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම විවර වීම ඉතා වැදගත් සමාජ පරිවර්තනයක් වූ බව මෙහිදී සඳහන් කිරීම වටී.

සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති පරිදි ගුරුවරයකු තම සිසුන් කෙරෙහි දැරිය යුතු වගකීම් වශයෙන් තම සිසුන් විනයගරුක කිරීම, දයානුකම්පාවෙන් අධ්‍යාපනය ලබා දීම ගුරු මුෂ්ඨියකින් තොරව උගැන්වීම, තම මිතුරන්හට සිසුන් හඳුන්වා දීම, ආරක්ෂාව සැලසීම යනාදි කරුණු පැහැදිලි කර දී ඇත. අධ්‍යාපනයේ වටිනාකම මෙතකැයි කියා නිම කල නොහැක්කකි. බුදුරජාණන් වහන්සේ ධර්මය තුළින්ද අපට කියා දී ඇත්තේ එයයි.

පැරණි සංස්කෘත ආප්තෝපදේශ ග්‍රන්ථ එනම් පංචතන්ත්‍රය, හිතෝපදේශය වැනි කුඩා ග්‍රන්ථ වල පවා අධ්‍යාපනයේ ඇති වැදගත් වටිනා ස්වභාවය හුවා දක්වා ඇති තැන් තිබේ.

උදා - ස්ව ගෘහේ පූජ්‍යතේ මූර්ඛඃ
ස්ව ග්‍රාමේ පූජ්‍යතේ ප්‍රභූඃ
ස්ව දේශේ පූජ්‍යතේ රාජා
විද්වාන් සර්වත්‍ර පූජ්‍යතේ

නුවණින් මද මූර්ඛ පුද්ගලයා පිදුම් ලබන්නේ තම නිවසිනි. ප්‍රභූවරයා තම ගමින් පිදුම් ලබයි. රජු තම දේශයෙන් පිදුම් ලබයි. එහෙත් විද්වාන් හෙවත් උගතා සියලු තන්හි පිදුම් ලබයි. සර්වත්‍ර කියනුයේ එයයි. සියලු ස්ථානයන් යන්නයි.

එමෙන්ම අපේ වදන් කවි පොතේ එන පරිදි,

තිබූ තැනෙක සොර සතුරන් ගත නොහෙනා
ඒ සැඩ මනාවත් වතුරෙන් වල නොහෙනා
කෝප වුවත් රජ මැතිඳුන් ගත නොහෙනා
උගත මනා ශිල්පය මයි මතු රැකෙනා

එමෙන්ම ලෝකෝපකාරයේ අප කවුරුත් දන්නා පරිදි මෙසේ දැක්වේ.

දෙගුරුන් විසින් තම දරුවන්ට දෙන නොමඳ දන නම්
වියතුන් සභා මැද ඉන්ට ඉදිරිව ශිල්ප දෙනු මැයි

ආදි කාලීන හින්දු හා ලාංකික සමාජයෙහි ද අධ්‍යාපනයට දී ඇති වටිනාකම සහ ජීවිතයට එහි ඇති වැදගත්කම මෙකී සාහිත්‍යමය කෘතීන් හි අන්තර්ගත ආප්තෝපදේශ ශ්ලෝක කවි තුලින් දැක්වීම අධ්‍යාපනයේ ඇති වටිනාකමේ සර්ව කාලීන බව පිලිබිඹු කර දෙයි.

මෙතෙක් කල් අප ජීවිතයේ දී ලබා ඇති වැදගත්ම අත්දැකීමක් වන්නේ කිසිම අවස්ථාවක හැම අතින්ම සමාන මනුෂ්‍යයන් දෙදෙනෙකු සොයා ගැනීමට ඇති නොහැකියාවයි. නිවුන් දරුවන් දෙදෙනකු වුවද සැම අතින්ම සමාන නොවේ. සියලු දෙනාම එකිනෙකාට වෙනස් පුද්ගලයෝ වෙති.

''නානත්ත කායා නානත්ත සංඥා''

මෙය බුදු වදනින් මනාව පැහැදිලි කර දී ඇත. පෞරුෂ වර්ධනය පිළිබඳ මූලික ඉගෙන්වීම කරමින් තථාගතයන් වහන්සේ කියා දුන් "පද්මාකාර ජීවිතය" මෙහිලා අප කවුරුත් දන්නා කරුණක් ලෙස සඳහන් කල හැකිය.

පුද්ගල පෞරුෂයද මෙවැනිම සංසිද්ධියක් වන අතරම. එහි අගය මැනීමට ස්ථිර මිනුම් දණ්ඩක් නැත. මේ නිසාම එක් එක් අයගේ පෞරුෂ වර්ධනය විවිධ මට්ටම් ගනී.

"පෞරුෂය" යන්න නිර්වචනය කිරීමේදී ස්ථාවර ක්‍රමවේදයක් නොමැති අතර, නොයෙක් විවිධ වූ කෝණයන්ගෙන් බැලීම වටී. එක් අර්ථ කථනයකට අනුව පෞරුෂ යන්න යමෙකුගේ ජීවිතයට අද්විතීය (unique) සකස් කිරීමක් ඇති කරන්නා වූ හැසිරීම්, සංජානනීය සහ චිත්තවේගීය (behavioural, congenitive and emotional) යන අංගයන් එකිනෙකට සම්බන්ධ වූ එකතුවක් ලෙස දක්වා ඇත.

තවත් නිර්වචනයක පුද්ගලයකුගේ හැසිරීම පූර්ව කථනය කර නැති ලක්ෂයන්ගේ එකතුවක් ලෙස දක්වා ඇත.

ප්‍රධාන ලක්ෂණ 05 ක් හඳුනා ගනිමින් පෞරුෂත්වය විමසා බැලීමට ගොඩනගා ඇති න්‍යායට අනුව අත්දැකීමට විවෘත බව, සවිඥානික බව, අන් අය සමග ගැවසීමට ඇති කැමැත්ත පෞරුෂත්වයේ ප්‍රධාන ලක්ෂණ තුනක් ලෙස හඳුනාගෙන ඇත.

සෑම අයෙකුටම සුවිශේෂී වූ පෞරුෂයක් උපතින් හිමිව තිබුණා වුවත් කාලයත් සමග වයසින් මුහුකුරා යෑමේදී වන, පෞරුෂය වර්ධනය සඳහා යම් සාධක පදනම් කර ගනිමින් යොමු වන ක්‍රමවේද හේතු කාරක වනු ඇත. පෞරුෂ සංවර්ධනය යනු චර්යාවේ සිදුවන වැඩිදියුණු වීම්, වෙනස් වීම් මතින් වන ක්‍රියාවලියයි.

අප සැමගේ පෞරුෂය එකිනෙකාට සුවිශේෂි වේ.

එය ගණනය හෝ මැනීම ස්ථිරව සිදු කිරීමට නොහැකි වුවත්, කෙනෙකුගේ පෞරුෂ රටාව තවත් කෙනෙකුගේ පෞරුෂයට කෙළින්ම බලපාන අවස්ථා දක්නට ලැබේ. මේ නිසාම කෙනෙකුට සුවිශේෂී වූ ලක්ෂණයන් මත අනිකාට යහපතක් හෝ අඩුම තරමින් අයහපතක් නොවන අන්දමින් පෞරුෂය ගොඩනගා ගැනීම කාගෙත් හිත සුව පිණිස හේතු වේ.

විවිධ අංගයන්ගේ සංකලනයක් වන පෞරුෂය විදහා දැක්වීම සඳහා යම් බාහිර භෞතික ලක්ෂණයන්හි බලපෑමක්ද තිබිය හැක. යමෙකුගේ දේහ ලක්ෂණ, ගමන් විලාසය, ඇඳුම් පැළඳුම් පවා පෞරුෂ විකාශය වෙත බලපෑමට ඉඩ තිබේ. එය එසේ වුවත් බාහිර පෙනුමෙන්ම පමණක් පෞරුෂත්වය විදහා දැක්වීමක් නොවේ. මින් පෙනෙන එක් කරුණක් නම් පෞරුෂය බොහෝ ලක්ෂණයන්හි සංකලනයක්ම නිසා එකී ලක්ෂණයන්ගේ වෙනස්කම් ඇති කර ගැනීම තුලින් යහපත් පෞරුෂ වර්ධනයක් ලබා ගැනීමේ හැකියාව අප සැමට ඇත.

මේ නිසාම අධ්‍යාපනය තුලින් අප සැමගේ යහපත් පෞරුෂ වර්ධනයක් ඇති කර ගැනීමේ වටිනා අවස්ථාවක් මනුෂ්‍යයාට උදා වී තිබේ.

අධ්‍යාපන මනෝ විද්‍යාව අනුව අධ්‍යාපනය ලැබීම තුලින් පුද්ගලයෙකුගේ දැනුම, ආකල්ප මෙන්ම කුසලතාවයන්ද වර්ධනයක් ඇති කර ගැනීමට හැකිවනු ඇත. මෙම ගුණාංගයන් අධ්‍යාපනයේ මූලික පරමාර්ථයක් වන චර්‍යාමය වෙනසක් ඇති කර ගැනීමට බෙහෙවින් ඉවහල් වේ. මෙවැනි චර්යාමය වෙනසක් හේතුවෙන් යහපත් පෞරුෂ වර්ධනයන් ලබා ගැනීමේ අවස්ථාව පූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීම තුලින් සෑම පුද්ගලයෙකුටම උදා වේ.

මෙහිදී අපගේ අවධානය යොමු විය යුතු වැදගත්ම කරුණක් වන්නේ අධ්‍යාපනය තුලින් පෞරුෂ වර්ධනය ලගා කර ගත හැකි ලක්ෂණ තුනෙන් ආකල්පමය වෙනසක් හෝ ආකල්පයන්ගේ වැඩි දියුණුවකට නිසි අවස්ථාවක් නොලැබුණොත්, අධ්‍යාපනයේ මූලික පරමාර්ථයක් වන චර්යාවෙහි වෙනසක් සිදුවේද යන්නයි. දැණුම සහ කුසලතාවයන්හි වර්ධනයට අවස්ථාව ලැබුණ ද, චර්‍යාවේ වෙනසක් නැත්නම් ගුණාත්මක වර්ධනයක් සඳහා ආකල්පයන්ගේ වර්ධනය අත්‍යවශ්‍ය බව අවිවාදයෙන් යුතුව පිළිගත යුතුය.

මහත්මා ගාන්ධිතුමා අධ්‍යාපනය තුලින් පෞරුෂ වර්ධනය කර ගැනීම සම්බන්ධව දැක්වූ අදහස වූයේ අධ්‍යාපනය තුලින් කියවීම, ලිවීම සහ ගණිතය පිළිබඳ දැනුම ලබා ගැනීම මතම පමණක් පෞරුෂ වර්ධනයක් ලබා ගත නොහැකි බවයි. ඉහත අංගයන්ට අමතරව අත, හදවත සහ සිරසෙහි යන අභ්‍යන්තර අංගයන්ගේ වර්ධනයද පෞරුෂය කෙරෙහි බලපාන බව එතුමාගේ අදහස විය. එනම් අධ්‍යාත්මික ගුණ වගාවයි.

මෙම අදහස අධ්‍යාපන මනෝ විද්‍යාවේ දැණුම, ආකල්ප සහ කුසලතා ත්‍රිත්වය වැඩි දියුණු කර ගැනීමේ රීතියටම අනුගාමී බව මැනවින් පෙනේ.

පෞරුෂ වර්ධනය සඳහා චර්යාවෙහි වෙනසක් ඇතිකර ගත හැකි ආකල්පමය වර්ධනයන් අධ්‍යාපනය තුලින් ලබා ගැනීමට ඇති අවශ්‍යතාවය නැවත නැවතත් සිහි ගැන්වේ.

මේ අනුව, දැණුම සහ කුසලතා යන අංගයන් පමණක් කේන්ද්‍ර කර ගනිමින් ලබන්නා වූ අධ්‍යාපනයක් තුලින් කොතෙක් දුරට මුලු මහත් සමාජයේම යහපත උදා කර ගත හැකි වන්නේ දැයි මැනවින් වටහා ගත හැකි වේ.

යහපත් පෞරුෂයකින් හෙබී තැනැත්තෙකුගෙන් මුලු මහත් සමාජයටම ඇතිවන ධනාත්මක අගය නිමක් නැත. අප සැවොම අවම වශයෙන් අනෙකෙකුට හිංසාවක් පීඩාවක් නොවන අයුරින් මෙන්ම ඔවුන්ගේ යහ පැවැත්ම හා අයිතීන් සඳහා ගරු කරන පෞරුෂයකින් යුත් තැනැත්තන් තමා වේ නම් එදිනෙදා අපට මුහුණ දීමට සිදුවන අපහසුතා ගැටුම් බොහෝ දුරට මග හැරී යනු ඇත.

එමෙන්ම ඉන් ඔබ්බට ධනාත්මක යහපත් පෞරුෂ වර්ධනයක් තුලින් මතු කර ගන්නා වූ චර්යාවන්ගෙන් අනූනව සමාජයට පිවිසෙන්නා වූ තැනැත්තන්ගේ ක්‍රියාකාරකම් මගින් මුලු මහත් මනුෂ්‍ය ප්‍රජාවට පමණක් සීමා නොවූ මුලු පෘථිවියේම අභිවෘද්ධියට උපකාරී නොවන්නේ ද ?

එවැනි ගුණාංගයන්ගෙන් හෙබී පුද්ගලයින්ගෙන් නොයෙක් තලයන් හි පවත්නා ක්‍රියාකාරකම් උදෙසා නායකත්වයක් සඳහා වූ අනුග්‍රහය මිල කල නොහැකි වටිනාකමක් ගනී යැයි හැගේ.

එය එසේ වන්නේ නම්, පූර්ණ අධ්‍යාපනයක් තුලින් යහපත් ධනාත්මක පෞරුෂ වර්ධනයක් තම ගුරු පියසට පැමිණෙන්නා වූ සිසු සිසුවියන් සඳහා ලබා දීමට ඇති ඉඩ අවකාශ උපරිම මට්ටමින් දීමට කටයුතු කිරීම ගුරුවරයෙකුගේ ප්‍රධානතම වගකීමක් නොවේද ?

මෙවැනි කාරණා මැනවින් වටහාගෙන එය ප්‍රායෝගික බිම් මට්ටම කරා ගෙනවිත් තම ගුරු පියසට පැමිණෙන්නා වූ දහස් ගණන් සිසුවන්ට නිසි මග පාදා දීම තම මූලික අරමුණ කරගත්, අද දිනයේ අප කථානායකවරයානන්ගෙන් අප විදුහල් මාතාවට පමණක් නොව මුලු මහත් සමාජයටම සිදු වූ සේවාව වෙනුවෙන් එතුමාණන්ට උපහාර පිදීම මලියදේවයන් වූ අප සැමගේ කෘතවේදී යුතුකමක් සේ සළකමු.

වසර 15 ක් පුරා වූ එතුමාගේ නායකත්වය යටතේ එවකට සිසුනට සිප් සතර ලබාදුන් සියලුම ගුරු මෑණිවරුන් සහ ගුරු පියවරුන් තම උපරිම සේවය ලබා දීමට කටයුතු කිරීම අප සැමගේම භාග්‍යයක් කොට සළකමු.

මානව හිමිකම් පිළිබඳ වූ විශ්ව ප්‍රකාශයෙහි 26 වන නීතිය 2 වන අනු නීතිය අනුව ''මානව හිමිකම් සහ මූලික නිදහසට වූ ගෞරවය වැඩිදුරටත් ශක්තිමත් කරන්නා වූ සහ මනුෂ්‍ය පෞරුෂයෙහි පූර්ණ වර්ධනයක් සඳහා යොමු වන්නා වූ අධ්‍යාපනයක් ලබා දිය යුතු බවට සඳහන්ව ඇත''.

එමෙන්ම ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 29 (අ) රීතියට අනුව දරුවාගේ පෞරුෂය කුසලතා සහ මානසික ශාරීරික හැකියාවන් උපරිමව වර්ධනය කිරීම මූලික වූ අධ්‍යාපනයක් ලබා දීමට සියලුම රාජ්‍යයන් බැඳී ඇති බවට දක්වා ඇත.

අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික හිමිකම් පරිච්ඡේදය යටතේ ''අධ්‍යාපනය'' මූලික අයිතිවාසිකමක් ලෙස ප්‍රකාශිතව සඳහන් වී නොමැති වුවද, 6 වන පරිච්ඡේදය වන රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙය වීමේ මූලධර්ම සහ මූලික යුතුකම් නැමැති පරිච්ඡේදයෙහි 27 (2) (උ) ව්‍යවස්ථාවට අනුව ජනතාවගේ සදාචාරයෙහිත් සංස්කෘතියෙහිත් පූර්ණ වර්ධනය තහවුරු කිරීම අරමුණු කොට ගන්නා වූ සමාජයක් ශ්‍රී ලංකාවේ ඇති කිරීමට රජය ඇප කැප වී ඇති බවට ප්‍රකාශිතවම සඳහන් වී ඇත.

අධ්‍යාපනය සම්බන්ධයෙන් අප නීති පද්ධතියේ ඇති සියලුම ප්‍රතිපාදනයන් පිළිබඳ වූ සවිස්තර විග්‍රහයකට හෝ සාකච්ඡාවකට මෙය සුදුසු අවස්ථාවක් නොවන හෙයින් ඉහත දක්වා ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනය මූලික කරගෙන සරලව දැක්විය හැකි වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය කිහිප අවස්ථාවකදීම රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම යටතේ ඇති ප්‍රතිපාදනයන් අනුව අවශ්‍ය කටයුතු සැළැස්වීම රජයේ වගකීමක් බවය. පොහොය දිනවල සහ ඉරිදා දිනවල සවස 3.00 දක්වා උපකාරක පංති පැවැත්වීම

තහනම් කිරීම පිණිස නිවාඩු පනතට ඉදිරිපත් කල සංශෝධනයක ව්‍යවස්ථාපිතභාවය පරීක්ෂා කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත්තේ අදාළ නීතිමය ප්‍රතිපාදනයක් මගින් සමාජයේ විවිධ තලයන්හි විවිධ වූ වගකීම් දැරීමේදී සදාචාරාත්මක, සංස්කෘතික හා ආගමික මූල ධර්මයන් වෙත නිසි ගෞරවයෙන් හා සංවේදීතාවයක් ඇතිව කෙසේ කටයුතු කළ යුතුද යන්න පිළිබඳව ඉගෙනීමට ඇති අවස්ථාවට හානියක් නොවන ලෙස විෂයානුබද්ධ පොත්පත් අනුසාරයෙන් ලබන අධ්‍යාපනය ලබා ගැනීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම, මනාව ගෙන හැර දක්වා ඇති බවය.

ශ්‍රේෂ්ඨාධිකරණය තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ, පෙළපොත් ආශ්‍රිත හෝ පාසල් විෂය මාලා විභාග කේන්ද්‍රකරගත් අධ්‍යාපනයට අනවශ්‍ය ප්‍රමුඛස්ථානයක් ලබා දීම මගින් අධ්‍යාපනයේ සමස්ථ පරමාර්ථය හෑල්ලු කිරීමට හෝ සීමා කිරීමට ගන්නා උත්සාහ මගින් අධ්‍යාපනය සඳහා වූ අයිතියට ද, එහි සාර්ථකත්වයට ද හානිදායක වනු ඇත.

දැනුම- ආකල්ප- කුසලතා

මනුෂ්‍ය ස්වභාවය අධ්‍යාපනය සහ ලෝකය පිළිබඳව නිසි තේරුම් ගැනීම යන සිද්ධාන්තයක් පිළිබඳ මහා දාර්ශනිකයන් ඉදිරිපත් කල මතයක් කෙරෙහි කෙටියෙන් අවධානය යොමු කිරීම මෙහිදී උචිත වේ යයි සිතමි. ඇරිස්ටෝටල් සහ ජෝන් ලොක් විසින් මනුෂ්‍ය සිත කිසිවක් නොලියූ ගල් ලෑල්ලක් ලෙසට ගෙන හැර දක්වා ඇති අතර, ජීවිත කාලයේදී ඔහු ලබා ගන්නා අත්දැකීම් තුලින් එකී හිස් ගල්ලෑල්ල පුරවා ගැනීමට කටයුතු කරනු ලබන බවය.

මේ අනුසාරයෙන් අධ්‍යාපනඥයෙක් ප්‍රකාශ කර ඇත්තේ, එම හිස් ගල්ලෑල්ල නිසි ලෙස පිරවීමට එනම් ළදරුවෙකුගේ හිස් මනස නිසි ලෙස සකස් කිරීමට ඇති හොඳම මෙවලම අධ්‍යාපනය බවයි.

එනම් පූර්ණ අධ්‍යාපනයකින් නිසි ලෙස සැකසුණු පුද්ගලයෙක් සමාජයට බිහි කරලීමට ඇති හැකියාව පිළිබඳව ඔහු දක්වා ඇත.

අධ්‍යාපනය සහ පෞරුෂ වර්ධනය පිළිබඳව මේ වන විට ගෙන හැර දැක්වූ කරුණු සළකා බැලූ විට ගරු ඩී.බී. දිසානායක විදුහල්පතිතුමන්ගේ ධූරකාලය තුලදී අප පාසල් මාතාව සෙවනේ අධ්‍යාපනය ලැබීමට තරම් වූ වාසනාවක් හිමිවීම ගැන මා පුද්ගලිකවම ඉතාමක් සතුටට පත් වෙමි.

බී.ඒ. සහ එම්.ඒ. (ශාස්ත්‍රපති හා ශාස්ත්‍රවේදී) උපාධි ලබා ගනිමින් අධ්‍යාපනය පිළිබඳ මනා දැනුමකින් යුක්තව වසර 14 කට ආසන්න කාලයකට විදුහල්පති ධූරය හෙබවූ ඩී.බී. දිසානායකයන් තම ධූර කාලය තුලදී පූර්ණ අධ්‍යාපනයක ඇති වැදගත්කම සහ ධනාත්මක වූ පෞරුෂ වර්ධනයක් සඳහා අවශ්‍ය සාධක සහිත පරිසරයක් පාසැල තුල ඇති කිරීමේ වැදගත් බවද මනා ලෙස වටහාගෙන ක්‍රියාකර තිබීම අප කාගේ වාසනාවකට හේතු වේ.

විෂයානුබද්ධ ඉගැන්වීමේ සංසිද්ධියට බාහිරව ක්‍රීඩා සංගීතය සහ ශිෂ්‍ය භට වැනි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පහසුකම් හා ඉඩ සැලසීමට පියවර ගත්තා මෙන්ම සිසුන්ද එකී අවස්ථාවන්ගෙන් නිසි ප්‍රයෝජන ගැනීමට උත්සුක වූහ. පාසැල තුල හා පිටතදීත් සිසු විනය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් කටයුතු කල ඔහු බාහිර පෙනුම පිළිබඳවද ඉතාමත් උනන්දුවෙන් ප්‍රධාන තැනක් දෙමින් කටයුතු කරන ලදි.

මෙම සියල්ල එකට ගත්විට එම ලබාදුන් අවස්ථාවයන් තුලින් ''ආකල්පයන්'' වැඩි දියුණු කර ගැනීමටත් එමගින් යහපත් පෞරුෂයක් ලබා ගැනීමටත් සිසු දරුවන් උත්සුක වූහ.

අදටත් නොයෙක් ක්ෂෙත්‍රයන්හි ප්‍රධාන තනතුරු වල මෙන්ම අනිකුත් තලයන්හිද සේවා සපයන්නා වූ මලිදෙව් ආදී සිසුන් ගැන සලකා බැලූ විට ඩී.බී. දිසානායකයන් විසින් ඉදිකල ශක්තිමත් වූ අඩිතාලම මතින් මලිදෙව් සිසුන් ලෝකය ජයගත් ආකාරය අප සැමට දැකගත හැකිය.

එවැනි මගක් සකස් කර දුන් අප කාලයේ දිසාපාමොක් ඇදුරාණන්ට නැවතත් ශීර්ෂ ප්‍රණාමය පුද කරමින් අප පාසැල් මාතාව ඉතා දිගු කලක් යෙහෙන් වැජඹේවා යි පතමින් ඔබ සැමගෙන් සමුගනිමි.

ස්තූතියි